# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2022.08.15 |

## ශ්‍රී ලංකා ගැණුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2022 ජූලි


### 2022 ජූලි මාසයේ දී නිෂ්පාදන සහ සේවා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පහළ යන ලදී.

**නිෂ්පාදන ක්‍රියාකාරකම්හි පෙර මාසයට සාපේක්ෂව පසුබෑමක් පෙන්නුම් කරමින්, නිෂ්පාදන අංශයේ ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය 2022 ජූලි මාසයේ දී පහළ යන ලදී.** ඒ අනුව, නිෂ්පාදන අංශයේ ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය 2022 ජූලි මාසයේ දී පෙර මාසයට සාපේක්ෂව දර්ශකාංක 2.7කින් පහළ යමින් 41.4ක අගයක් වාර්තා කළ අතර, මේ සඳහා ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප දර්ශකය හැර අනෙකුත් සියළුම උප දර්ශකයන්ගේ සිදු වූ පහළ යෑම් හේතු විය.

| නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය | 2022 ජූනි මාසයට සාපේක්ෂව දර්ශකාංක 2.7 ක පහළ යෑමකි |
|---|---|
| **41.4** | |

2022 ජූලි මාසයේ දී පෙර මාසයට සාපේක්ෂව නව ඇණවුම් පහත වැටීම කෙරෙහි විශේෂයෙන්ම ආහාර හා පාන නිෂ්පාදන අංශයේ පැවති ඉල්ලුම පහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. පාරිභෝගිකයන්ගේ මිලදී ගැනීමේ හැකියාව පිරිහීම සහ ඉන්ධන හිඟය හේතුවෙන් පාරිභෝගිකයන් වෙළඳසැල් කරා පැමිණීම පහත වැටීම මෙලෙස ඉල්ලුම පහත යෑම කෙරෙහි බලපෑ ප්‍රමුඛ හේතුන් අතර විය. ඉල්ලුම අඩුවීමේත්, අමුද්‍රව්‍ය සහ ඉන්ධන හිඟය ආදි සැපයුම් අංශයේ අවහිරතාවන්හිත් සමස්ත ප්‍රතිඵලයක් ලෙස ජූනි මාසයට සාපේක්ෂව නිෂ්පාදන පහත වැටුණු අතර මේ කෙරෙහි විශේෂයෙන් ආහාර හා පාන නිෂ්පාදන අංශයේ සිදු වූ පහත වැටීම දායක විය. තවද, සේවා නියුක්තිය පහත වැටුණු අතර, විශේෂයෙන් ආහාර හා පාන නිෂ්පාදන අංශයේ, අනියම් සේවකයින්ගේ සේවය අත්හිටුවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. එසේ වුව ද, ජූලි මාසයේ දී රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශයේ සේවක සංඛ්‍යාව ඉහළ නංවා ගැනීමට හැකි වූ බව එම අංශයේ බොහෝ ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කරන ලදී. නව ඇණවුම් සහ නිෂ්පාදනයේ සිදු වූ පහත වැටීමට සමගාමීව තොග මිල දී ගැනුම් පහත වැටුණු අතර, මේ සඳහා දේශීය වෙළඳපොළ තුළින් ප්‍රමාණවත් පරිදි අමුද්‍රව්‍ය මිලදී ගැනීමට නොහැකි වීම සහ යෙදවුම් ආනයනය කිරීමේ දුෂ්කරතා ද හේතු විය. තවද, විශේෂයෙන් නැව් භාණ්ඩ ප්‍රවාහනය ආශ්‍රිතව පැවති ප්‍රමාදයන් සහ ඩීසල් හිඟය හේතුවෙන් ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය මෙම මාසය තුළ දී වැඩි විය.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | ජූනි | ජූලි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **44.1** | **41.4** | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| **උපදර්ශක** | | | | |
| නව ඇණවුම් | 38.3 | 39.0 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිෂ්පාදන | 36.2 | 32.0 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 45.7 | 45.0 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 34.8 | 32.7 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 72.8 | 62.6 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සැපයුම් අංශයේ පවත්නා අඛණ්ඩ අවහිරතාවයන්ට අමතරව ඉල්ලුම පහත වැටීමේ තත්ත්වය පිළිබඳ නිෂ්පාදකයින් කනස්සල්ලට පත්වීම හේතුවෙන් ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු පිළිබඳව අපේක්ෂාවන් තවදුරටත් පහත මට්ටමක පැවතිණි.

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2022 ජූනි මාසයට සාපේක්ෂව දර්ශකාංක 1.1කින් පහළ යමින් 2022 ජූලි මාසයේ දී 51.1ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

පෙර මාසයට සාපේක්ෂව 2022 ජූලි මාසයේ දී ඉන්දියාව සහ සිංගප්පූරුව යන රටවල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය වැඩි වේගයකින් ද එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, රුසියාව සහ චීනය යන රටවල අඩු වේගයකින් ද වර්ධනය විය. එසේ වුවද, යුරෝපා කලාපයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පෙර මාසයට සාපේක්ෂව ජූලි මාසයේ දී පහළ යන ලදී.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2022 අගෝස්තු 14 වන දිනට*

[1] *එස්&පී ග්ලෝබල්* (S&P Global) *ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, අඛණ්ඩව සිව්වන මාසයටත් සේවා ක්‍රියාකාරකම්වල පසුබෑමක් පෙන්නුම් කරමින්, 2022 ජූලි මාසයේ දී 43.0ක දර්ශක අගයක් වාර්තා කළේය.** මෙම අඛණ්ඩ පසුබෑම සඳහා හේතු වූයේ නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්තිය සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් යන උප දර්ශකවල පහළ යෑමයි.

ප්‍රධාන වශයෙන්, ප්‍රවාහන, දේපළ වෙළඳාම සහ නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා යන උප අංශවල දක්නට ලැබුණු පහළ යෑම් සමඟ, 2022 ජූනි මාසයට සාපේක්ෂව 2022 ජූලි මාසයේ දී නව ව්‍යාපාර තවදුරටත් පහත වැටුණි.

පැවති උග්‍ර ඉන්ධන හිඟය මධ්‍යයේ බොහෝ උප අංශවල දක්නට ලැබුණු පහළ යෑම් සමඟ සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් 2022 ජූලි මාසයේ දී තවදුරටත් පහත වැටුණි. මීට අමතරව, බොහෝ ප්‍රතිචාර දක්වන්නන් විසින් දිගින් දිගටම සඳහන් කරන ලද පරිදි, අනෙකුත් සැපයුම් සම්බන්ධව පවත්නා දුෂ්කරතා මෙන්ම දුර්වල ආර්ථික තත්ත්වයන්, මිල ඉහළ යෑම් සහ ගමනාගමනය ආශ්‍රිත ගැටළු හේතුවෙන් ඉල්ලුම අඩු වීම, සේවා අංශයේ ව්‍යාපාරික ක්‍රියාකාරකම්වලට අහිතකර ලෙස බලපෑවේය. ඒ අනුව, ප්‍රවාහන, නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා සහ අනෙකුත් පෞද්ගලික සේවා යන උප අංශවල සැලකිය යුතු පහළ යෑම් ජූලි මාසය තුළ වාර්තා විය.

ව්‍යාපාර ක්‍රියාකාරකම්වල පහළ යෑම මධ්‍යයේ නව බඳවාගැනීම් අත්හිටුවීම් හා සේවා ගිවිසුම් දීර්ඝ නොකිරීම් හේතුවෙන් සහ විශ්‍රාම යෑම් හා සේවයෙන් ඉවත්වීම් හේතුවෙන් 2022 ජූලි මාසයේ දී සේවා නියුක්තිය අඛණ්ඩව පහළ ගියේය. මේ අතර, සැපයුම හා සම්බන්ධ සීමාකාරී තත්ත්වයන්, විශේෂයෙන් ඉන්ධන සැපයුමේ හිඟතාව, කාර්ය මණ්ඩලවලට මුහුණ දීමට සිදු වූ ප්‍රවාහන දුෂ්කරතා සහ විදුලි කප්පාදුව හේතුවෙන් නිමකිරීමට නියමිත කාර්යයන් තවදුරටත් ඉහළ ගියේය.

| විචල්‍යය | ජූනි | ජූලි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **40.3** | **43.0** | **+** | **අඩු වේගයකින් පහළ යෑමක්** |
| | | <u>උපදර්ශක</u> | | |
| නව ව්‍යාපාර | 43.2 | 41.2 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 35.1 | 36.9 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 38.9 | 36.7 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 52.2 | 52.2 | = | සමාන වේගයකින් ඉහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 32.3 | 48.0 | + | අඩු වේගයකින් පහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් 2022 ජූලි මාසයේ දී මන්දගාමී වේගයකින් වුවද තවදුරටත් පහත වැටුණු අතර, මේ සඳහා සැපයුම් සම්බන්ධව පවත්නා විවිධ අවිනිශ්චිතතා මධ්‍යයේ සමාගම් වලට අඛණ්ඩව මුහුණ දීමට සිදුවන අසීරුතාවන් හේතු විය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**43.0**

**2022 ජූනි මාසයට සාපේක්ෂව දර්ශකාංක 2.7ක ඉහළ යෑමකි.**

සේවා අංශයෙහි
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි වර්ධනයක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2022 ජූනි මාසයේ පැවති 53.9 සිට 2022 ජූලි මාසයේ දී 51.1ක් වාර්තා කළේය.

චීනය, ඉන්දියාව, එක්සත් රාජධානිය සහ ජපානය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2022 ජූලි මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කළ අතර, ඇමරිකා එක්සත් ජනපදයේ එය පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2022 අගෝස්තු 14 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.